**<u>සැබෑ වූ සිහිනය මොරගහකන්ද - කළුගඟ බහු කාර්යය ව්‍යාපෘතිය තුළින් පිබිදෙන රජරට වියළි කලාපීය ජන ජීවිතය.</u>**

මාතලේ දිස්ත්‍රික්කයේ දුම්බර මිටියාවතේ නකල්ස් නිම්නයේ වර්ග කි.මී. දහසකට ආසන්න ජල පෝෂක ප්‍රදේශයෙන් ඇරඹෙන අඹන් ගඟ සහ කළුගඟේ ජලධාරාව කළමණාකරණය කරමින් ඉදිවන මොරගහකන්ද සහ කළුගඟ මහා ජලාශ මේ වන විට ඉදිකිරීම් අවසන් කරමින් පවතී. එය අක්කර අඩි 660,000 ක මහා ධාරිතාවයකින් යුක්ත වන අතර එය පරාක්‍රම සමුද්‍ර ජල ධාරිතාවය මෙන් සය ගුණයක් විශාල වූවකි.

මොරගහකන්ද ජලාශයේ වර්ග ප්‍රමාණය වර්ග කි.මී. 29.5 යි. කළුගඟ ජලාශය වර්ග කිලෝ මීටර් 14.5 යි.

මෙම ජලාශය නිසා දියවර සපයන ප්‍රධාන වාරි පද්ධති 04 කි.

**සෘජුවම දියවර සපයන**

01. ඉහළ ඇළහැර මහා ඇළ ව්‍යාපෘතිය

    හුරුළුවැව, තිසා වැව, නාච්චදූව වැව, නුවරවැව, මහකනදරාව, ඇතුළුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ලොකු, කුඩා වැව් 1,200 කට පමණ තිරසර ලෙස වසර පුරා ජලය සැපයීම සැලසුම් කරයි. මෙම ඇළ මාර්ගය කි.මී. 94 ක් දිගින් යුක්ත වන අතර කි.මි. 28 උමං මාර්ගයක් සහිතවේ. මෙම මොරගහකන්ද ජලාශය වෙත කළුගඟ ජලාශයෙන් ජලය සපයනු ලබන කි.මී. 09 ක් දිගැති ඇළ මාර්ගයක් ද කි.මී. 7.85 උමගක් සහිතව එකී ඉහල ඇළහැර මහා වාරි ව්‍යාපෘතිය මගින් ඉදිකිරීම් කටයුතු කරමින් පවතී.

02. මොරගහකන්ද ජලාශය මගින් දියවර සපයන අනෙක් ඇළ මාර්ග පද්ධතිය වන්නේ පැරණි ඇළහැර - මින්නේරිය යෝධ ඇළ හරහා ගිරිතලේ, මින්නේරිය, කවුඩුල්ල, කන්තලේ දක්වා දිවෙන ඇළ මාර්ගයයි. මේ හැර පරාක්‍රම සමුද්‍ර ජලාශය වෙත කළුගඟ ජලාශ ප්‍රදේශයේ ජලය සැපයීම අංගම්මැඩිල්ල හරහා ක්‍රියාත්මක වේ. මැදිරිගිරිය නව සංවර්ධන කලාපයේ හුදෙකලාව පැවති පවුල් 12,000 ක පමණ ජනතාවට වැව් 32 ක් ඉදිකරමින් බෙදුම් ඇළ මාර්ගය කි.මී 16.5 ක් සහ වාරි පද්ධතීන් ඉදිකර ජලය සැපයීම් කිරීමට කටයුතු කරමින් පවතී. වසරේ එක් කන්නයක් පමණක් ඉතාමත් අවධානමින් යුතුව වගා කළ ජනතාවගේ යල, මහ කන්න තිරසාරව වගා කිරීමට මෙම වාරි පද්ධතිය මහෝපකාරී වනු ඇත. කන්තලේ දක්වා ඇළ මාර්ගය දැනට ඉදිකර අවසන් කර ඇති අතර මේ නිසා එකී ජලාශ සඳහා මෙතෙක් කිසිදා නොවූ අයුරින් ජලය සැපයීමේ හැකියාව සොමිනස් සහගතව දැකිය හැකිය.

03. මොරගහකන්ද - කළුගඟ ජලාශ ඉදිවීම නිසා අහිමි වූ බිම් ප්‍රමාණය ගම්මාන 24 කි. එකී ගම්මාන 24 හි පවුල් 3,000 කට කළුගඟ පහළ නිම්න ප්‍රදේශයේ ගෙවතු සහ වාරි ඉඩම් සපයමින් දියවර සැපයීම කරනු ලබයි. මෙම ප්‍රදේශය තුළ ඇළ පද්ධතිය මෙන්ම වැව් 16 ක් ඉදිකර දියවර සපයීමට ක්‍රියාකරමින් පවතී.

ඉහත සඳහන් ව්‍යාපෘති 03 මඟින් හෙක්ටයාර් 82,000 ක භූමි ප්‍රමාණයක් සඳහා ජලය සැපයීමට ක්‍රියා කරමින් පවතී.

දස ලක්ෂයකට අධික අනුරාධපුරය, පොළොන්නරුව, ත්‍රිකුණාමලය සහ මධ්‍යම පළාතට අයත් ප්‍රදේශ සඳහා පිරිසිදු පානීය ජලය සහ කර්මාන්ත සඳහා අවශ්‍ය ජලය සැපයීමට සැලසුම් කර ඇත.

**මොරගහකන්ද - කළුගඟ ජලාශ ඉදිවීම නිසා වක්‍රව ප්‍රතිලාභ ලබන වයඹ මහ ඇළ සංවර්ධන ව්‍යාපෘතිය**

මොරගහකන්ද ජලාශයට කළුගඟ ජලාශයේ අතිරික්ත ජලය සැපයීම නිසා බෝවතැන්න සහ නාලන්දා ජලාශයෙන් ලැබෙන ජලය වයඹ ප්‍රදේශයට යොමු කිරීමට හැකියාව ලැබී ඇත. මෙමඟින් අක්කර අඩි 105,000 ක් වෑමැඩිල්ල, දේවහුව, මහකිතුල, මහකිරුල ජලාශ හරහා පොල්පිතිගම, ගල්ගමුව ප්‍රදේශයට යොමු කිරීමට හැකියාව ලැබී ඇත. මෙම වයඹ මහ ඇළ ව්‍යාපෘතිය කි.මී. 93 ක් වන අතර එය කුරුණෑගල ගල්ගමුව ප්‍රදේශයේ මහා නාන්නේරිය ජලාශයෙන් අවසන් වේ. මෙම මහා ඇල ව්‍යාපෘතිය මඟින් ලොකු, කුඩා වැව් 353 ක් පෝෂණය වන අතර හෙක්ටයාර් 12,500 ක පවුල් 13,500 ක් සඳහා ජලය සැපයීමටත් පවුල් 40,000 කට පමණ පානීය ජලය කර්මාන්ත ජලය සඳහා අනෙකුත් අවශ්‍යතා සඳහා දියවර සැපයීමටත් හැකියාව ලැබේ.

අතීත රාජ්‍ය සමයන්හී ජනාවාස වූ මෙම ප්‍රදේශවල ජනතාවට වසරේ කෙටි කලක් තුළ (මාස 04 ක් වැනි) ලැබෙන වර්ෂා ජලය රැස්කර වසර පුරා වගා කටයුතු කර ගැනීම සඳහා ප්‍රථමයෙන්ම කුඩා වැව් ද පසුව මහා වැව් ද වශයෙන් වැව් දස දහස් ගණනක් ඉදිවෙමින් වැව් බැඳි රාජ්‍යයක් ලෙස අන්වර්තනාමයෙන් වසර දහස් ගණනක් තිස්සේ සමෘද්ධිමත් ප්‍රෞඩ ඉතිහාසයකට උරුමකරුවන්ව සිටි බව ඓතිහාසික සාධක හෙළි කරයි. පසු කාලීනව ජන සංඛ්‍යාව වර්ධනය වීමත් නව ගොවි ජනාවාස බිහිවීමත් පරිසර හානියට ලක්වෙමින් වැව් විධිමත් ප්‍රතිසංස්කරණයකට භාජනය නොවීමත් නිසා එම ප්‍රදේශවල ජනතාවගේ තිරසර පැවැත්ම කඩා වැටුණි. ජලාශවල එක් රැස් කරගත හැකි ජල ප්‍රමාණය වසර පුරා වගා කටයුතු සඳහා යොදා ගැනීමට නොහැකි වීම තුළ අඩ සියවසකට අධික කාලයක් එකී වයඹ, උතුරුමැද, නැගෙනහිර සහ මධ්‍යම ප්‍රදේශයේ බහුතර ජනතාව තම ගොවිතැන් කටයුතු කරගැනීමේ අපහසුතාවකින් පසු වූ අතර එක් කන්නයක් පමණක් අපහසුකම් මධ්‍යයේ වගා කිරීමේ තත්වයක් මත ඉතාමත් කටුක දිවි පෙවෙතක උරුමකරුවන් බවට පත්විය. තම අතීත මුතුන් මිත්තන්ගේ සමෘද්ධිය හා අභිමානය ඔවුන් කෙරෙන් ඈත් වෙමින් පවතුනි. මන්දපෝෂණය, දුස් පෝෂණය මෙන්ම වකුගඩු ආසාදන වැනි රෝග පීඩාවන්ට ලක්වුණි. තම දරුවන් වූ අනාගත පරපුර අසරණ තත්වයකට පත්වුණි. ඔවුන් විසින් විවිධ අයුරින් ඉල්ලීම් උද්ඝෝෂණයන් කරමින් දසක 05 කට අධික කාලයක් කරන ලද ඉල්ලීම්වල දී වත්මන් ජනාධිපතිතුමා එම ජනතාව නියෝජනය කරමින් අතීතයේ පටන් ගෙන ගියා වූ සටනේ සිහිනය මල්ඵල ගන්වන වර්තමානය හා අනාගතය උදාවී ඇත. ඒ තුළ හෙක්ටයාර් 95,000 කට අධික බිම් ප්‍රදේශයක කර්කශ වූ වියලි භූමිය නැමැති දේහය සඳහා ජලය නැමැති රුධිරය සපයමින් පවතී. එම ඉලක්කගත ප්‍රදේශවල ජනතාවගේ අතීත සමෘද්ධිය මෙන්ම අනාගත මහා සංවර්ධනයක පදනම සකස් වෙමින් තිබේ. මෙකී ප්‍රදේශවල කෙත්වතු තෙත් බිම් බවට පත්වීම තුළ කෘෂිකර්මාන්තයේ ආහාර සඳහා අවශ්‍ය වී ඇතුළු ධාන්‍ය වර්ග එළවළු, පළතුරු නිෂ්පාදනය මෙන්ම මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයන්ට ඉහළ අගයක් ලබාදීමට සැලසුම් කරයි. ආනයනික කෘෂි බෝග සහ සත්ව පාලනය සඳහා වාර්ෂිකව වැයවන රු. මිලියන ලක්ෂයකට අධික විදේශ විනිමය ඉතිරි කරගැනීමට සැලසුම් සකස් වෙමින් පවතී. අභ්‍යන්තරිකව යටිතල පහසුකම් සංවර්ධනය, මූල්‍යායතන ඇරඹීම පරිසර සංරක්ෂණය මඟින් මෙන්ම විශාල වර්ධනයක් ගෙන එනු ලබන සංචාරක ව්‍යාපාරය සංවර්ධනයේ ගොඩනැගීම සැලසුම් කරයි.

**මොරගහකන්ද ව්‍යාපෘතියෙන් ලැබෙන අනෙකුත් ප්‍රතිලාභ**

- මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වාර්ෂිකව මෙ.ටො. 4700 - වටිනාකම රු මිලියන 1,000
- මෙ.වො. 25 විදුලි බල නිෂ්පාදනය - වාර්ෂිකව රු මිලියන 1,545
- සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය

  විදුලි බෝට්ටු සේවාව

  කේබල් කාර් සේවාවන්

  හෝටල් කර්මාන්තය

  බතික් කර්මාන්තය

- යටිතල පහසුකම් සංවර්ධනය තුළ ප්‍රදේශයේ පවතින සහ නිෂ්පාදනය කරන භාණ්ඩ සඳහා නව අගයන් එකතුවීම.
- ලග්ගල, අඹන සහ මැදිරිගිරිය නගර සංවර්ධනය
- මනම්පිටිය, සෝමාවතිය ඇතුළු පහළ නිම්න ප්‍රදේශවලට වාර්ෂිකව බලපාන ගංවතුර තර්ජන වලකාලීම.
-

**ව්‍යාපෘතිය සඳහා වැයවන සමස්ථ වියදම රුපියල් කෝටි 23,000 කි.**

**සෘජු ප්‍රතිලාභ ලබන ජන සංඛ්‍යාව දස ලක්ෂයකට අධික වේ.**

01. මොරගහකන්ද - කළුගඟ බහුකාර්ය ජලාශ ව්‍යාපෘතිය සඳහා
    ඇ.ඩො.මි. 770.41 රු.මිලියන 123,200

02. ඉහළ ඇලහැර ඇළ ව්‍යාපෘතිය
    ඇ.ඩො.මි. 450 රු.මිලියන 72,000

03. වයඹ පලාත් ඇළ ව්‍යාපෘතිය
    ඇ.ඩො.මි. 200 රු.මිලියන 32,000

04. මිනිපේ වම් ඉවුරු ඇළ සංවර්ධනය
    ඇ.ඩො.මි. 25 රු.මිලියන 4,000

- මැදිරිගිරිය බිසෝපුර නගරය සංවර්ධනය සඳහා
  රු.මිලියන 10,000

- කළුගඟ ජලාශ ඉදිකිරීම, යටිතල පහසුකම් සංවර්ධනය, දේපල සඳහා වන්දි ලබාදීම, පරිසර සංරක්ෂණය හා පිරිසිදු පානීය ජල යෝජනා ක්‍රමය සඳහා
  රු.මිලියන 60,000